<u>මහව ප්‍රාදේශීය සභාව</u>

<u>මහව ප්‍රාදේශීය සභාවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ තනතුරුවලට /සේවා ගිවිසුම් පදනම මත බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම</u>

මහව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ තනතුරු සඳහා වයඹ පලාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන අනුව විවෘත පදනම මත බඳවා ගැනීමට කටයුතු කෙරේ.අයදුම්පත් කැඳවීම අවසන් දිනට එනම්, 2026.01.15 දිනට පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ (මහව/අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල) පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. 1. බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරු හා පුරප්පාඩු සංඛ්‍යා

අනු අංකය	තනතුරු නාමය	පුරප්පාඩු සංඛ්‍යාව
01	වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මාර්ග කම්කරු)	03
02	සෞඛ්‍ය කම්කරු	03

11. තනතුරු වල ස්භාවය

අනු අංකය	තනතුරු නාමය	තනතුරට පැවරෙන කාර්යය
01	වැඩ/ක්ෂේත්‍ර කම්කරු(මාර්ග කම්කරු)	මාර්ග දෙපස එළිපෙහෙලි කිරීම, මාර්ග අළුත් වැඩියා කිරීම, කාණු කැපීම, බොරලු ඇතිරීම,ගොඩනැඟිලි ඉදිකිරීම් කටයුතු, අනතුරුදායක ගස් කපා ඉවත් කිරීම, තාර දැමීම,තණ කොළ කැපීම හා අවස්ථානෝචිතව අදාළ වෙනත් රාජකාරි කටයුතු ඉටු කිරීම
02	සෞඛ්‍ය කම්කරු	,වීදි ඇමදීම හා කාණු පිරිසිදු කිරීම,පොදු වැසිකිළි සෝදා පවිත්‍ර කිරීම,කසල බැහැර කිරීම,කාර්යාල ගොඩනැගිලිවල අදාල පිරිසිදුකිරීම් ඉටුකිරීම,පරිසර විෂය සම්බන්ධ අංශ ප්‍රධානීන් හා ආයතන ප්‍රධානීන් විසින් නියම කරනු ලබන අදාල වෙනත් රාජකාරී කටයුතු ඉටුකිරීම

02. බඳවා ගැනීමේ ක්‍රමය-

මූලික සුදුසුකම් සම්පූර්ණ කරණු ලබන අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයකට හා සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දිය යුතුය.එම පරීක්ෂණ වලින් ලබා දෙන ලකුණු වල කුසලතා මට්ටම අනුපිළිවෙලට පවත්නා පුරප්පාඩු තනතුරුවලට බඳවා ගනු ලැබේ.

03. අධ්‍යාපන සුදුසුකම් -

අවම අධ්‍යාපන සුදුසුකම වනුයේ රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය(9 වසර) සමත්වී තිබීම.

04. වෙනත් සුදුසුකම් -

1. මෙම තනතුර සඳහා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

11 . අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුයි.

111. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් සමන්විත විය යුතුය.

1V . දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවී දඩුවම් ලැබුවකු නොවිය යුතුය.

V. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03 ක් මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.(පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත අදාල ප්‍රාදේශීය ලේකම් මගින් සනාථ කළ යුතුය.)

05. වැටුප් පරිමාණය -

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 වැටුප් චක්‍රලේඛය අනුව ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයට අදාල (PL1) වැටුප් පරිමාණය අනුව නේතික පදනම මත වැටුප් ගෙවීම සිදු කෙරේ.

6.1. සේවා කොන්දේසි -

මෙම තනතුර සේවා ගිවිසුම් මත කොන්ත්‍රාත් පදනමින් බඳවා ගනු ලබයි. තවද රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල සඳහා 8% ක දායකත්වයක් ඔබ විසින් දැරිය යුතුයි.

6.2. මෙම තනතුර මාස 06 කින් අවසන් වන කොන්ත්‍රාත් ගිවිසුමකින් සමන්විතය.(සේවා ගිවිසුම් කාලය සේවා අවශ්‍යතාවය මත යාවත්කාලීන කරනු ලබයි.)

07. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතික වල අනු පිටපත් ඇමිණිය යුතුය.

1. උප්පැන්න සහතිකයේ පිටපත
2. අධ්‍යාපන සහතික වල පිටපත් හා ශිෂ්‍ය කාර්ය දර්ශකයේ පිටපත
3. ජාතික හැඳුණුම්පතේ පිටපත
4. ග්‍රාම නිලධාරි සහතිකය
5. චරිත සහතිකය

08. අයදුම්පත් එවිය යුතු පිළිවෙල :- සියලුම අයදුම්කරුවන් මෙහි පහතින් ඇති අයදුම්පත්‍රය අනුව පිළියෙල කරගත් A4 කඩදාසි ප්‍රමාණයේ අයදුම්පතක් 2026.01.15 දිනට පෙර ලැබෙනසේ "ලේකම්, ප්‍රාදේශීය සභාව,මහව." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.අයදුම්පත් www.mahopradeshiyasabha.lk වෙබ් අඩවියට පිවිස හෝ පහත සඳහන් QR කේතය මගින් ද භාගත කර ගත හැකිය.

- ඉල්ලුම් කරන තනතුර අයදුම්පත බහාලන කවරයේ ඉහල වම් කෙලවරේ අයදුම් කරන තනතුර මාර්ග කම්කරු තනතුර / සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා යනුවෙන් සඳහන් කළ යුතුය.

ලේකම්.
මහව ප්‍රාදේශීය සභාව